


# අබා

සිංහල වීර කතා සම්ප්‍රදායේ දැවැන්ත සිනමා නිර්මාණයට පෙරනිමිත්ත, මීට වසර 2400කට ප්‍රථම අබා කුමරුගේ බිහි වීමත් සමඟින්ම උදා විය. උපදින්නටත් පෙර සිටම මරණයට නියම වී සිටි පණ්ඩුකාභය කුමරු, ඉන් ගලවා ගැනීමේ ත්‍රාසජනක කතාන්දරය ලක් ඉතිහාසයේ සිදු වූ බිහිසුණුම දේශපාලන කුමන්ත්‍රණය වෙයි.

දීප වංශය, මහා වංශය, වංසත්තප්පකාසිනී වැනි ඉතිහාසයේ මූලාශ්‍රයන්හි අක්මුල් සොයා යමින්, හැකිතාක් නිවැරදි දත්ත සපයා ගනිමින් සහ විශ්ලේෂණය කරමින් ''අබා'' නම් වූ කතා වස්තුව ඔබ වෙත දිග හැරෙයි.

ඉතිහාසය යනු වාර්තා හෝ සිදුවීම් ගොන්නකි. ඒවා එකින් එක පිරික්සා එක හුයකට අමුණා මනා නිමැවුමක් කළ හැකි වන්නේ අති විශිෂ්ට කලා කෘතියකටම පමණක් වන හෙයින් ''කලාව ඉතිහාසයට වඩා දාර්ශනික'' බව ඇරිස්ටෝටල් පවසා තිබේ. ඉතා දක්ෂ රංගන ශිල්පියෙකු වූ ජැක්සන් ඇන්තනි ගේ අධ්‍යක්ෂණයෙන් හෙළ සිනමාවේ දැවැන්තම සිනමා කෘතිය, ''අබා'' හෙළයේ මහා වීර කාව්‍යය ලෙසින් ඉතිහාසගත වෙයි.





## සිංහල සිනමා වංශ කතාවේ දැවැන්තම සිනමා නිර්මාණය

### දැන් ඔස්ට්‍රේලියාවේ

සන්නස සහ Lanka Vision YOUR RUPAVAHINI IN AUSTRALIA

එක්ව ඉදිරිපත් කරයි

## කතාව

පණ්ඩුවාස දේව රජුට දාව භද්‍ර කච්චායනා අග මෙහෙසියට පිරිමි දරුවන් දස දෙනකු ද, දුටුවන් වශී කරන රුව ඇති දියණියක ද වූ අතර ඇගේ ජන්ම නැකතට අනුව අනාගතයේ දිනෙක ඇ විසින් බිහි කරන්නා වූ පුතණුවන් විසින් ඇගේ සොහොයුරන් දස දෙනාම මරා රජ වන බව දෛවඥයන් විසින් පවසයි. චිත්‍රා නම් වූ ඇය, කාගේ වුවද සිත කුල්මත් කරන බැවින් උන්මාද චිත්‍රා නමින් ප්‍රකට වෙයි.

දෛවඥ පුවත් හෙළි වීමෙන් චිත්‍රාවන් මරා දමන්නට සොහොයුරන් සැලසුම් කරන අතර මව වූ භද්‍ර කච්චායනා දේවිය විසින් ඇ එක්ටැම් ගෙයක රඳවා රැක ගනී.

දීඝායු කුමරුන්ගේ පුත් දීඝ ගාමිණී, චිත්‍රාවන් පිළිබඳ පුවත් අසා, චිත්තරාජ සහ කාලවේල නම් වන යක්ඛ ගෝත්‍රයට අයත් තම මිතුරන් දෙදෙනාද කැටුව උපතිස්ස නම් වූ ගමෙහි පිහිටි මාලිගාවෙහි පදිංචි වෙයි. දීඝ ගාමිණී කුමරු, චිත්‍රා කුමරිය හා රහසේම පෙම් සබඳකමක් ඇති කර ගනී. ඉතිහාසයේ දැක්වෙන ආකාරයට ඇය එක්ටැම් ගෙයි සිටියදීම ගැබ්බර වන අතර එ පුවත් සැළ වූ සැණින් සොයුරන් ඇ මරා දමන්නට කල්පනා කරයි. අවසන, ඇය පුතෙකු බිහි කළහොත් පමණක් වැදුම් ගෙයි දී ම මරා දමන්නට භද්‍ර කච්චායනා දේවිය තම පුතුන් එකඟ කරවා ගනී.


Jagath J Edirisinghe

## අනතුරුව, කුමක් සිදුවුණි ද ?

වීරෝදාර ලක් ඉතිහාසයකට මංපෙත් හෙළි කරමින් එලෙස ඇරඹෙන පණ්ඩුකාභය යුගය, ''අබා'' තුළින් ඔබ වෙත අභිමානයෙන් යුතුව දිග හැරෙයි.

A Project of FOCAS Foundation